## අනගාරික ධර්මපාලතුමාගේ ජාතික මෙහෙවර පිළිබඳ විමසුමක්
## (අනගාරික ධර්මපාල අප්‍රකට අත් ලිපි ඇසුරෙන්)

**අයි.ආර්. නදීකා සඳමාලි පීරිස්**[1]

*[1]සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*

*nadeeka.pieris@yahoo.com

විදේශීය ආක්‍රමණ නිසා සිංහල භාෂාව සහ සංස්කෘතිය, බෞද්ධාගම සහ ආර්ථික වශයෙන් ද පිරිහීමට ලක් වුණි. සිංහල ජාතිකයෝ ඉංග්‍රීසි ජාතිකයන්ගේ වහලුන්ව සිටියහ. දූෂිත ක්‍රියාවන්ගේ යෙදුණු අතර මනා ආධ්‍යාත්මික සංවර්ධනයක් ද නොතිබුණි. මෙලෙස අස්ථාවර ව පැවති අවධියක, ශ්‍රී ලංකා දේශයේ ජාතික, ආගමික සහ සංස්කෘතික ප්‍රබෝධයෙහිලා උත්කෘෂ්ට මෙහෙවරක් සිදු කළ අනගාරික ධර්මපාලතුමා 'ජාතියේ පියා' ලෙස ද හැඳින්වූහ. එතුමා එවක නිදා සිටි සිංහල ජනතාව අවදි කරමින් යළි ශ්‍රී ලාංකේය ජාතික සංවර්ධනය නංවාලීමට කටයුතු කර ඇත. ඒ සඳහා මහා බෝධි සමාගම ඇති කර ධර්ම ප්‍රචාරක කටයුතුවල නිරත වීම, අමද්‍යප ව්‍යාපාරය ආරම්භ කිරීම, ජාත්‍යාලය ඇති කිරීමට දේශන පැවැත්වීම සහ විදේශ රටවල සංචාරය කරමින් බුදුදහම ලොව පතළ කිරීම ආදිය සිදු කළේය. එවන් කාර්යභාරයක් ඉටු කළ අනගාරික ධර්මපාලතුමාගේ ජාතික මෙහෙවර පිළිබඳ විමර්ශනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ ප්‍රධාන අරමුණයි. එසේම සමකාලීන සමාජයට ද අනගාරික ධර්මපාලතුමාගේ චරිතය අදාළ කර ගත හැකිද? යන්න විමර්ශනය කිරීම ද මෙම අධ්‍යයනයේදී අපේක්ෂිතය. මෙහිදී අනගාරික ධර්මපාලතුමා ආදර්ශවත් චරිතයක් වූයේ කෙසේ ද? ශ්‍රී ලාංකේය ජාතික සංවර්ධනය උදෙසා ඔහු සතුව පැවති අදහස් මොනවා ද? අන් අය අමතනු සඳහා සිය භාෂාව විශේෂිතව භාවිත කළේ කෙසේ ද? යනාදී පර්යේෂණ ගැටලු පිළිබඳ මෙම අධ්‍යයනයේදී සාකච්ඡා කරයි. ප්‍රථමව මාතෘකාවට අදාළ පූර්ව කියවීම් හා අවශ්‍ය න්‍යායික ප්‍රවේශය ලබා ගැනීම මූලිකව සිදුවේ. පුස්තකාල ග්‍රන්ථ හා ලේඛන පරිශීලනය ප්‍රමුඛ වේ. පුවත්පත්, වාර සඟරා, මුද්‍රිත හා අමුද්‍රිත මූලාශ්‍රය පරිහරණය මඟින් ප්‍රාථමික හා ද්විතීයික දත්ත ලබා ගැනීම සිදුවේ. ප්‍රාථමික සහ ද්විතියික දත්ත තුලනාත්මක නිරීක්ෂණය මගින් තර්කානුකූල නිගමනයන්ට එළඹීම සහ විස්තරාත්මක ව විවරණය කිරීම සිදු වෙයි. 'අනගාරික ධර්මපාලතුමාගේ ජාතික මෙහෙවර පිළිබඳ විමසුමක් ' යන අධ්‍යයනය සමකාලීන බෞද්ධාගමික ප්‍රබෝධය ඇති කරලීමට ඉමහත් දායකත්වයක් වනු ඇත.

මුඛ්‍ය පද ඃ අනගාරික ධර්මපාලතුමා, ජාතික මෙහෙවර, අප්‍රකට අත් ලිපි